| 02 | ඊසීසී 12 | තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී<br><br>පූර්ණ කාල දිවා - හය මාසික | (1) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො.ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය, මාධ්‍ය භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වීම.<br><br>(2) 2016.01.01 වැනි දිනට වයස අවු. 17 හා 29 අතර විය යුතු ය. | *සිංහල මාධ්‍යය :*<br>**NVQ** මට්ටම 4<br>අනුරාධපුරය, ගාල්ල, කුරුණෑගල, මහනුවර, වරකාපොල, මාතර,මැදගම, ගම්පහ, මරදාන, රත්නපුර කෑගල්ල, බදුල්ල, හසලක, බණ්ඩාරවෙල, නුවරඑළිය, පාතදුම්බර, රත්මලාන, අම්පාර, ත්‍රිකුණාමලය, මාතලේ, බෙලිඅත්ත, මොණරාගල, කළුතර, කුලියාපිටිය, ඇඹිලිපිටිය, බලපිටිය, වීරවිල, වාරියපොල, දඹුල්ල, දෙහිඅත්තකණ්ඩිය, පොළොන්නරුව<br><br>දෙමළ මාධ්‍යය :<br>**NVQ** මට්ටම 4<br>යාපනය, සම්මන්තුරේ, වවුනියාව, මඩකලපුව, මන්නාරම, අක්කරපත්තුව, ත්‍රිකුණාමලය<br><br>ඉංග්‍රීසි මාධ්‍යය :<br>**NVQ** මට්ටම 4<br>මඩකලපුව |

| අනු. අංකය | සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුළත්වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍ය/NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්‍ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 03 | ඊසීසී 01 | ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්‍ෂක<br><br>පූර්ණ කාල දිවා එක් අවුරුදු | (1) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො.ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය, මාධ්‍ය භාෂාව හා විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වීම.<br><br>(2) 2016.01.01 වැනි දිනට වයස අවු. 17 හා 29 අතර විය යුතු ය. | *සිංහල මාධ්‍යය :*<br>**NVQ** මට්ටම 4<br>වරකාපොල, කුරුණෑගල, අනුරාධපුරය, මරදන, රත්නපුර, ආනමඩුව, දඹුල්ල, දෙහිඅත්තකණ්ඩිය ඇඹිලිපිටිය, ගම්පහ, හෝමාගම, කළුතර, කුලියාපිටිය, මාතර, ගාල්ල, රත්මලාන, බදුල්ල, අම්පාර, වීරවිල, නුවරඑළිය, බණ්ඩාරවෙල, හසලක, කෑගල්ල, පොළොන්නරුව, මොණරාගල, මහනුවර, මාතලේ, බෙලිඅත්ත, බලපිටිය, වාරියපොල<br><br>*දෙමළ මාධ්‍යය :*<br>**NVQ** මට්ටම 4<br>සම්මන්තුරේ, මඩකලපුව, වවුනියාව, මන්නාරම, අක්කරපත්තුව, යාපනය, ත්‍රිකුණාමලය |

**අර්ධ කාලීන පාඨමාලා**

| | | | | |
|---|---|---|---|---|
| 04 | ඊසීසී 12.1 | තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී<br><br>අර්ධ කාල පැය 720<br><br>අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු විය යුතු ය. | (1) දෙවරකට නොවැඩි වාර ගණනක දී අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය, මාධ්‍ය භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වීම.<br><br>(2) 2016.01.01 වැනි දිනට වයස අවුරුදු 17ට වැඩි විය යුතු ය. | *සිංහල මාධ්‍යය :*<br>**NVQ** මට්ටම 4<br>ගාල්ල, රත්නපුරය, කළුතර, මාතර, හසලක, මාතලේ, වරකාපොල, වීරවිල, බලපිටිය, අම්පාර, බෙලිඅත්ත, මරදාන, කෑගල්ල, ඇඹිලිපිටිය, ත්‍රිකුණාමලය, බදුල්ල<br><br>*දෙමළ මාධ්‍යය :*<br>**NVQ** මට්ටම 4<br>සම්මන්තුරේ, යාපනය, වව්නියාව, ත්‍රිකුණාමලය අක්කරෙයිපත්තුව |

*තාක්‍ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාල ලැයිස්තුව*

| *අනු. අංකය* | *තාක්‍ෂණ/කාර්මික විද්‍යාලය* | *ලිපිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ |
| 02. | ගාල්ල තාක්ෂණ විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල | ගාල්ල |
| 03. | මහනුවර තාක්ෂණ විද්‍යාලය | අරුප්පල, මහනුවර | මහනුවර |
| 04. | යාපනය තාක්ෂණ විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය |
| 05. | බදුල්ල තාක්ෂණ විද්‍යාලය | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල |
| 06. | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | නව නගරය, අනුරාධපුරය | අනුරාධපුරය |
| 07. | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | පුත්තලම පාර, කුරුණෑගල | කුරුණෑගල |
| 08. | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය | ඉගිනියාගල පාර, අම්පාර | අම්පාර |
| 09. | රත්නපුරය තාක්ෂණ විද්‍යාලය | ෆාම් ගාර්ඩින්, කොළඹ පාර, රත්නපුරය | රත්නපුරය |
| 10. | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල | කෑගල්ල |
| 11. | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලු පාර, රත්මලාන | කොළඹ |
| 12. | මාතර කාර්මික විද්‍යාලය | මැද්දෙවත්ත, මාතර | මාතර |
| 13. | සම්මන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ | අම්පාර |
| 14. | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර | කළුතර |
| 15. | වරකාපොල කාර්මික විද්‍යාලය | අගුරුවැල්ල පාර, වරකාපොල | කෑගල්ල |
| 16. | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය | කුරුණෑගල |
| 17. | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට | මහනුවර |
| 18. | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය | නුවරඑළිය |
| 19. | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම | කොළඹ |
| 20. | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත | හම්බන්තොට |
| 21. | හසලක කාර්මික විද්‍යාලය | යෝධ ඇල පාර, හසලක | මහනුවර |
| 22. | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල | මාතලේ |
| 23. | බලපිටිය කාර්මික විද්‍යාලය | දුම්රියපොළ පාර, වඳුරුව, බලපිටිය | ගාල්ල |
| 24. | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල | කුරුණෑගල |
| 25. | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්චන්තුඩුවෙයි, මඩකලපුව | මඩකලපුව |
| 26. | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල | බදුල්ල |
| 27. | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල | මොණරාගල |
| 28. | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල | ගම්පහ |
| 29. | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| 30. | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය | අම්පාර |
| 31. | මාතලේ කාර්මික විද්‍යාලය | එම්.සී. පාර, මාතලේ | මාතලේ |
| 32. | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල | හම්බන්තොට |
| 33. | මැදගම කාර්මික විද්‍යාලය | මැදගම, බිබිලේ හරහා | මොණරාගල |
| 34. | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව | පොළොන්නරුව |
| 35. | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නව නගරය, ඇඹිලිපිටිය | රත්නපුරය |
| 36. | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, වවුනියාව | වවුනියාව |
| 37. | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව | අම්පාර |
| 38. | ආණමඩුව කාර්මික විද්‍යාලය | ගම්උදා භූමිය, තම්මැන්නාගම, ආණමඩුව | පුත්තලම |
| 39. | මන්නාරම කාර්මික විද්‍යාලය | පන්නායි, වෙඩිඩුවන් හන්දිය, මඩුපාර | මන්නාරම |

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

(1984 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලදී)

නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා** Courses in Graphics, Multimedia and Printing

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්‍ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි. පහත සඳහන් පාඨමාලා වලට බඳවා ගැනීම දැන් ආරම්භ කර ඇත.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව -**

**Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time) :**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. එක් පුහුණු කණ්ඩායමකට බඳවා ගනු ලබන්නේ 8 දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායම් නිසා සීමාසහිත අපේක්‍ෂකයන් සංඛ්‍යාවක් පමණක් සම්මුඛ පරීක්‍ෂණයක් ආධාරයෙන් තෝරාගනු ලැබේ.

**පුහුණු ක්‍රමය :** මාස 2ක කාලයක් පූර්ණ කාලීනව ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදීම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සිදු කෙරේ, ඉන් අනතුරුව මාස 12ක් මුද්‍රණාලයකට අනුයුක්ත කොට පූර්ණ කාලීන ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙන අතර මෙම කාලය තුළ සතියකට වරක් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වර්ණ යන්ත්‍ර ආශ්‍රිතව ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම වර්ධනය වන අයුරින් විශේෂ පංති පැවැත්වේ.

**පාඨමාලා කාලය : මාස 14යි (අර්ධකාලීන)** **මාධ්‍යය : සිංහල** **පාඨමාලා ගාස්තුව : රු. 20,850**

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - MS Office :**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පුළුල් අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන අතර පරිගණකය පිළිබඳව මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය නවකයින්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා ගැනීමට කැමති සියලු දෙනාට පොදුවේ ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

**පාඨමාලා කාලය : මාස 4යි (අර්ධකාලීන)** **මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි** **පාඨමාලා ගාස්තුව : රු. 10,850**

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිගණක ආශ්‍රිත මුද්‍රණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**
**Computer Typesetting & Layout Designing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාව මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබා දෙන අතර මුල සිටම පරිගණක දැනුම පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය පිළිබඳව මනා දැනුමක් ලබා දේ.

**පාඨමාල කාලය : මාස 5යි (අර්ධකාලීන)** **මාධ්‍යය : සිංහල** **පාඨමාලා ගාස්තුව : රු. 12,850**

**පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course in Computer Graphic Design**

අද රැකියා අංශයේ ඉතා ඉහල ඉල්ලුමක්ව පවතින මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයට යොමු වීමට අවශ්‍ය දැනුම ලැබෙන අයුරින් මෙම පාඨමාලාවේ අන්තර්ගතය සකසා ඇති අතර ඉතා පුළුල් පුහුණු කාලයක් තුළ සෑම ශිෂ්‍යයෙකුටම ඵලදායීතාවයක් ලැබෙන අයුරින් විෂය නිර්දේශය සකසා ඇත. පරිගණක ආශ්‍රිත නිර්මාණකරනයට උනන්දුවක් දක්වන නවකයන්ටත් ග්‍රැෆික්ස්, ප්‍රචාරක මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රවල නියැලී පුද්ගලයන්ටත් මෙම පාඨමාලාව ඉතා ඵලදායී වනු ඇත. මෙම පාඨමාලාව හැදෑරීමෙන් ග්‍රැෆික් මෘදුකාංග පිළිබඳ මෙන්ම ග්‍රැෆික් නිර්මාණය පිළිබඳව ඉතා පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලැබේ.

ඉහත පාඨමාලා සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර දැන් බඳවා ගැනීම ආරම්භ කොට ඇත.

**පාඨමාලා කාලය : මාස 5යි (අර්ධකාලීන)** **මාධ්‍යය : සිංහල** **පාඨමාලා ගාස්තුව : රු. 15,350**

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබා දේ. පාසැල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලනරූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන සහ චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන්හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 04 - (අර්ධකාලීන) මාධ්‍යය - සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. - 20,850**

**වෙබ් අඩවි නිර්මාණ කරණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබාදෙන අතර නවීන තාක්‍ෂණයට අනුකූලව පාඨමාලා අන්තර්ගතය සකස් කර ඇත. පරිගණක ක්‍ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම පරිගණක ආශ්‍රිත පාඨමාලා හදාරණ සිසුන්ට ද මෙම ක්‍ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයින්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 5යි මාධ්‍යය - සිංහල /ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 15,350**

**ද්විමාණ සහ ත්‍රිමාණ සජීවිකරණය පිළිබඳ පාඨමාලාව - 2D and 3D Digital Animation**

අද ප්‍රචලිතව පවතින සජීවිකරණ මෘදුකාංග ඇසුරෙන් ද්විමාන සහ ත්‍රිමාන චලන රූප නිර්මාණය කර ඒවා චිත්‍රපට, රූපවාහිනී සහ වෙනත් වීඩියෝ කාර්‍යයන්ට භාවිතා කරන අයුරු මෙම පාඨමලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ. මේ සඳහා උනන්දුවක් දක්වන නවකයන්ට මෙන්ම එම අදළ ක්ෂේත්‍රවල නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

**පාඨමාලා කාලය - මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව - රු. 20,850**

**පරිගණක දෘඩාංග එකලස් කිරීම හා සැකසීම - Computer Hardware and Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙද පැන නගින දෘඩාංග/මෘදුකාංගවල අදළ තාක්‍ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත්සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්‍ෂණයේ නියැලි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

**පාඨමාලා කාලය - මාස 04 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල පාඨමාලා ගාස්තුව - රු. 11,350**

**පොත් බැඳුම්කරණය - Book Binding**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයින්ට ද ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇත.

**පාඨමාලා කාලය - මාස 07 (අර්ධ කාලීන) මාධ්‍යය - සිංහල පාඨමාලා ගාස්තුව - රු. 15,850**

විමසීම් - ප්‍රධාන කාර්යාලය :-
ලේඛකාධිකාරි, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162, ඊමේල් : sliopreg@sltnet.lk
web : www.sliop.edu.lk

මාතලේ ශාඛාව :
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිසා ලේකම් කාර්යාලය - මාතලේ.
දුරකථනය : 066 2222172
ජංගම : 071 0554298 , 0774119211

09-35

---

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ගොවිපල් කළමනාකරු, ව්‍යාප්ති නිලධාරි හා තාක්ෂණික නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු අංකය | තනතුරු නාමය |
|---|---|
| 01 | ගොවිපල් කළමනාකරු |
| 02 | ව්‍යාප්ති නිලධාරී |
| 03 | තාක්ෂණික නිලධාරී |

02. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුවන්ගේ උපන් දිනය 1997.10.05 දින හෝ ඊට පෙර හා 1985.10.05 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

03. මෙම තනසතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) ඒ - (MN-3) අනුව රු. 15,005 - 4x180 - 6x240 - 11x320 - 20x360 රු. 27,885ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

05. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් සියලුම මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ.

අධ්‍යාපන සුදුසුකම් :-

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම;

සහ

ජීව විද්‍යාව, කෘෂිකර්මය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විද්‍යා විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය එකවර සමත් වීම;

වෘත්තීය සුදුසුකම් :

කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව පහත සඳහන් එක් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

(i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව
(ii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව
(iii) අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව
(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාව
(v) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාව
(vi) කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම
(vii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව
(viii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

06. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අංක 1 සිට 7 දක්වා ඡේද මුල් පිටුවට ද, අනෙකුත් ඡේද පිළිවෙලින් අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

(ආ) එක් අයදුම්කරුවෙකුට එක් තනතුරක් හෝ තනතුරු කිහිපයක් සඳහා අයදුම් කළ හැකි අතර, ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්වල පැහැදිලිව තනතුරු සඳහා ඉල්ලුම් කරන ප්‍රමුඛතාවය සටහන් කළ යුතු ය.

(ඇ) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.10.05 දින හෝ ඊට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(ඉ) පහතින් දක්වා ඇති පරිදි අයදුම්කරන තනතුරු සංඛ්‍යාවට අනුව අදාලවන විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 යටතේ රජයේ අදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර නොගන්නා අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

| අයදුම්කරන තනතුරු සංඛ්‍යාව | විභාග ගාස්තුව රු. |
|---|---|
| ගොවිපල් කළමනාකරු හා/හෝ ව්‍යාප්ති නිලධාරී තනතුර සඳහා | 500 |
| තාක්ෂණික නිලධාරී තනතුර සඳහා | 500 |
| ගොවිපල් කළමනාකරු හා/හෝ ව්‍යාප්ති නිලධාරී තනතුර සහ තාක්ෂණික නිලධාරී තනතුර සඳහා | 750 |

(ඊ) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකුල නොවන අයදුම්පත්‍ර, සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් පිළිබඳව දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(උ) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසැලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රු. 240,360ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

(ඌ) දැනටමත් රජයේ සේවයේ නියුතුවූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතු යි.

07. විභාග පරිපාටිය :

(අ) නිවේදනයේ සඳහන් වයස් සීමා තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) මෙම විභාගය 2015 නොවැම්බර් මස කොළඹ දී පමණක් පැවැත්වේ. විභාග දිනට දින 05කට කලින් ප්‍රවේශපත්‍ර නොලබන අපේක්ෂක/අපේක්ෂිකාවන් පහත සඳහන් විස්තර ඉදිරිපත් කරමින් නොපමාව බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙතින් විමසිය යුතුය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවන ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍ර තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දැක්වෙන තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

පහත සඳහන් තොරතුරු ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත :-

(i) විභාගයේ නම ;
(ii) අපේක්ෂක/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම ;
(iii) ලිපිනය ;
(iv) ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා අංකය ;
(v) විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය.

(ආ) විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපෙක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඇ) අනන්‍යතාවය .- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා,

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ; හෝ
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

තම අනන්‍යතාවය තහවුරු කිරීමට අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ඉ) *විෂයය නිර්දේශය .-* ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු දෙකම සඳහා පැවැත්වෙනුයේ එක් ලිඛිත විභාගයක් පමණි.

| *විෂයය අංකය* | *විෂයය* | *කාලය පැය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* | *අදාළ වන තනතුර* |
|---|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 1 | 100 | 40% | සියලුම තනතුරු සඳහා |
| 02 | පොදු පරීක්ෂණය I (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) | 3 | 100 | 40% | ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු සඳහා |
| 03 | පොදු පරීක්ෂණය II (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) | 3 | 100 | 40% | තාක්ෂණික නිලධාරී තනතුර සඳහා |

(i) *බුද්ධි පරීක්ෂණය .-* (සියලුම තනතුරු සඳහා අදාළ වේ.)
අපේක්ෂකයාගේ, තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව සිතීමේ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ii) පොදු පරීක්ෂණය.- I (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) : (ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු සඳහා අදාළ වේ)

* සාමාන්‍ය කෘෂිකර්මය හා මූලධර්ම
* භෝග නිෂ්පාදනය හා මූලධර්ම ශෂ්‍ය විද්‍යාත්මක කරුණු
* පස හා පොහොර, ශාක පෝෂණය, පාරිසරික බලපෑම්
* භෝග ප්‍රචාරණ ක්‍රම
* රෝග හා පළිබෝධකාරකයන්, ලක්ෂණ හා හානි
* කෘෂිකාර්මික ප්‍රතිපත්ති, අතීත වර්තමාන හා අනාගත විභවයන්
* අපනයන කෘෂිකර්ම බෝග, ගම්මිරිස්, කුරුඳු, කෝපි, කොකෝවා, කරදමුංගු, කරාබු, සාදික්කා, බුලත්, පුවක්, වැනිලා සහ අනෙකුත් බෝගවලට අදාළ උද්භිද විද්‍යාත්මක කරුණු, දේශගුණික සාධක, පොහොර බලපෑම හා පෝෂණය, රෝග හා පළිබෝධ පසු අස්වනු තාක්ෂණය
* අපනයන බෝග අලෙවිය සහ අපනයන විභවයන්
* කාබනික ගොවිතැන
* ගොවිපල පාලනය, පැළ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, තවාන් පාලනය හා කාබනික ගොවිතැන
* කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රම හා ව්‍යාප්තිවේදය

(iii) පොදු පරීක්‍ෂණය II (තාක්‍ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්‍ෂණය) :- (තාක්‍ෂණික නිලධාරී තනතුර සඳහා අදළ වේ.)

* කෘෂිකාර්මික මූලධර්ම
  * ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප හා බෝග නිෂ්පාදනය කෙරෙහි ඒවායේ බලපෑම
  * පස් වර්ග, පාංශු සංරක්‍ෂණය, ශාක පෝෂණය හා ජල සංරක්‍ෂණය
  * පළිබෝධ හඳුනා ගැනීම, වර්ගීකරණය හා මර්දනය
  * ශාක ප්‍රචාරණය, තවාන් පාලනය හා පටක රෝපණය
  * කෘෂිකර්මය හා පරිසරය
  * වතු වගාව, ක්ෂේත්‍ර බෝග වගාව, මිශ්‍ර බෝග වගාව හා කෘෂි වන වගාව
  * පසු අස්වනු තාක්‍ෂණය
  * අපනයන කෘෂි බෝග අර්ථ දැක්වීම, ප්‍රචාරණය, ක්ෂේත්‍ර ස්ථාපනය, නඩත්තුව, රෝග පළිබෝධ පාලනය හා අස්වනු සැකසීම
  * ගොවිපළ පාලනය හා සැලසුම් කිරීම

* ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංවර්ධනය හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන එකිනෙකෙහි දයකත්වය
* රසායනාගාර උපකරණ හඳුනා ගැනීම, ප්‍රයෝජනය හා පිරිසිදු කිරීම සහ රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව පරිහරණය, ගබඩා කර තැබීම

(ඊ) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින අපේක්‍ෂකයන් අදළ සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය.

08. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) තෝරාගනු ලබන අපේක්‍ෂක/අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක දී වුව ද, සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
(ii) මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස සේවා කාලයකට යටත් වනු ඇත.

09. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන්ගේ මුලු ලකුණුවල කුසලතාවයේ අනු පිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබාගත් මුලු ලකුණුවල කුසලතා අනු පිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සියලුම බඳවා ගැනීම් නිම කිරීමෙන් අනතුරුව අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් අනෙකුත් අයදුම්කරුවන්ගේ ලකුණු නිකුත් කරන ලෙස දන්වූ පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තමා විභාගයේ දී එක් එක් විෂයයට ලබාගත් ලකුණු හා මුලු ලකුණු ඇතුලත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබාදීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

10. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුරට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් පත්වීම් ලැබීමට නුසුදුස්සකු සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

12. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි, යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. විභාගය පැවැත්වීම ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එන්. කේ. ඒ. රූපසිංහ,
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම් පත්‍රය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ ව්‍යාප්ති නිලධාරී, ගොවිපල් කළමනාකරු හා තාක්ෂණ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

Application for the Competitive Examination for Recruitment to the post of Extention Officer, Farm Manager and Technological Officer of Class III of the Sri Lanka Technological Service in the Department of Export Agriculture - 2015

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
දෙමළ 3
ඉංග්‍රීසි 4

02. අයදුම් කරන තනතුර/තනතුරු :

අයදුම් කරනු ලබන තනතුර හෝ තනතුරු ප්‍රමුඛතාවය අනුව සටහන් කළ යුතුය. එක් තනතුරක් සඳහා පමණක් අයදුම් කළ ද එම තනතුර සටහන් කළ යුතුය.

| *තනතුරු සඳහා ප්‍රමුඛතාවය* | *තනතුරු නාමය හා තනතුරු අංකය* |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |

03. නම :

3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

3.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————.
(උදා :- GUNAWARDHANA H. M. S. K.)

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
4.1 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
4.2 දුරකථන අංකය (ඇත්නම්) : ජංගම :

ස්ථාවර :

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී 1 පුරුෂ 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. විවාහක/අවිවාහක බව :
විවාහක - 2 අවිවාහක - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

08. 8.1 උපන් දිනය වර්ෂය : මාසය : දිනය:

8.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවු. : මාස : දින :

09. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අ. පො. ස. (සා. පෙළ)
වර්ෂය හා මාසය :————.
විභාග අංකය :————.
භාෂා මාධ්‍යය :————.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

(ආ) අ. පො. ස. (උ. පෙළ) :
වර්ෂය හා මාසය :————.
විභාග අංකය :————.
භාෂා මාධ්‍යය :————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

(ඇ) වෘත්තීය සුදුසුකම් :

| ඩිප්ලෝමාව සහ ආයතනයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|
| | | |

10.

| | |
|---|---|
| විභාග ගාස්තු ගෙවනු ලැබූ කුවිතාන්සියේ අංකය | |
| දිනය | |
| මුදල් ගෙවූ තැපැල් කාර්යාලය | |
| ගෙවන ලද මුදල | |

| විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ එක් දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

11. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි.

තවද මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................... යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී .................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

13. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තවූවෙක්නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

ඉහත තොරතුරු සඳහන් ........................................ මයා/මිය/මෙනවිය ...........................අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාව)

09-92

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| **සැප්තැම්බර්** | 2015.09.04 | සිකුරාදා | 2015.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.11 | සිකුරාදා | 2015.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.18 | සිකුරාදා | 2015.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.25 | සිකුරාදා | 2015.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2015.10.02 | සිකුරාදා | 2015.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.09 | සිකුරාදා | 2015.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.16 | සිකුරාදා | 2015.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.23 | සිකුරාදා | 2015.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.10.30 | සිකුරාදා | 2015.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2015.11.06 | සිකුරාදා | 2015.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.13 | සිකුරාදා | 2015.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.20 | සිකුරාදා | 2015.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.27 | සිකුරාදා | 2015.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.